## 271 සාමයේ ජීවිත මඟ

සාමයේ ජීවිත මඟ වෙත
මා යොමු කළ මැන ස්වාමිනේ
ජාතිය කුලය නිසා නොබෙදී
මානව බැතියෙන් එකමුතුවී
රටතුළ සමගිය ගොඩ නංවන්නට
දෙන්නැ වරම් ඔබගේ //

සම්දේ අප  ගුරු දෙවිඳේ
ඔබේ සැබෑ දහම් මගේ
පිය නංවමු නිබඳේ

ප්‍රේමයේ ජීවිත පිළිවෙත
දිරි ගන්වනු මැන ස්වාමිනේ
මුදු කරුණා ගුණයෙන් තෙත් වී
මෙත් මුදිතාවෙන් පිරිපුන් වී
මනු සත් වගට මැ සෙත් සළසන්නට
දෙන්නැ වරම් ඔබගේ //

සේවයේ ජීවන මං පෙත
එළිකර දෙනු මැන ස්වාමිනේ
පීඩිතයන් සිත සැනසුම දී
නැති බැරි අයහට අත හිත දී
ජන සෙත උදෙසා ඇප කැප වන්නට
දෙන්නැ වරම් ඔබගේ